22

දෙපාර්තමේන්තු චක්‍රලේඛ 04/2005

මගේ අංකය: ප/5/දෙපා/ච/2005

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය
දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

2005.08.05

සියළුම අධ්‍යක්ෂවරුන් හා අංශ ප්‍රධානින් වෙත.

## <u>රජයේ නිළධාරීන්ගේ කාර්යාල වේලාවන්</u>
## <u>හා නිවාඩු</u>

රජයේ කාර්යාලවල නිළධාරීන් හා සේවකයින්ගේ දිවා භෝජනය සඳහා වෙන්කර ඇති කාලය විනාඩි 30 ක් බවත්, එම කාලය හා රාජකාරි කටයුතු සඳහා කාර්යාලයෙන් බැහැර යන අවස්ථා හැරුණුවිට සෙසු කාලය තුළ ඔවුන් සේවා ස්ථානයේ රැඳී සිටිමින් රාජකාරි කටයුතුවල නිරත විය යුතු බවත්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2001 හි දැඩි ලෙස අවධාරණය කර ඇත. එහි පිටපතක් මේ සමඟ අමුණා ඇත.

02. තවද උක්ත කරුණ සම්බන්ධයෙන් 1998.02.03 දින ඔබ වෙත එවා ඇති අංක 346 දරණ දෙපාර්තමේන්තු චක්‍රලේඛයෙන්ද මේ පිළිබඳව දැනුවත් කර ඇත්තේ එහි සඳහන් උපදෙස් අනුව කටයුතු නොකරන අවස්ථා ඇති බැව් මා හට පෙනී ගොස් ඇත.

03. එබැවින් ඔබ අංශයේ සිටින කාර්ය මණ්ඩලයේ සියළුම නිළධාරීන් හා සේවකයින්ට දිවා භෝජනය විවේකය සඳහා විනාඩි 30 ක කාලයක් පමණක් ලබා ගැනිමට හැකිවන පරිදි වැඩ පිළිවෙලක් සකස් කළ යුතු අතර, අඛණ්ඩව සේවා ස්ථානයේ රාජකාරි කටයුතු ආවරණය වන ආකාරයට කණ්ඩායම් වශයෙන් ඉහත කී දිවා භෝජන විවේකය ලබා ගැනීමට කටයුතු කළ යුතු බැව් නැවතත් දැනුම් දෙමි.

(2)

එස්.කේ.ආර්.අමරසේකර
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:

01. සියළුම අධ්‍යක්ෂවරුන් වෙත.
ඉහත සඳහන් පරිදි ක්‍රියා කරන්නේද යන්න පිළිබඳව ඔබ පෞද්ගලිකව අධීක්ෂණය කර මා වෙත වාර්තා කිරීම සඳහා.

02. විගණන අංශය
මේ පිළිබඳව විටින් විට සොයා බලා මා වෙත වාර්තා කිරීම සඳහා.

චම්/-30